බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ
අංක 204 හි පිහිටි,
බස්නාහිර පළාත් සභා ගොඩනැඟිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී
**2013 දෙසැම්බර් මස 03, 04, 05 හා 06 යන දිනවල පෙ.ව 09.00 ට**

## *2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය*

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01.** ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.11.26 දින අසන ලද ප්‍රශ්නය: [ ප්‍ර / V (1) 13 / 16 ]

අ. ඔබ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ත්‍රීරෝද රථ සඳහා මීටර් ලබා දුන්නේද ?

ආ. එම මීටර් වර්ගය හා නිෂ්පාදන නාමය කුමක්ද?

ඇ. එක මීටරයක මිල කීයද?

ඈ. කොපමණ මීටර් සංඛ්‍යාවක් බෙදා දුන්නේද?

ඉ. එම මීටර් සඳහා කොපමන මුදලක් වැය කලේද ?

ඊ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ කර්මාන්ත අධිකාරිය මගින් ලබා දුන් ත්‍රීරෝද රථ මීටර් වර්ගයට වඩා ඔබ අමාත්‍යාංශය ලබාදුන් මීටර් වල ඇති වෙනස කුමක්ද?

උ. ඔබ අමාත්‍යාංශය මගින් ලබාදුන් මීටර් සවිකරන ලද ත්‍රීරෝද රථ වල අලවා ප්‍රදර්ශනය කරන ස්ටිකරයේ මහරගම නගර සභාවේ සභාපතිතුමියගේ ඡායාරූප ද ඇතුලත් කර ඇත්තේ කුමන පදනමකින්ද?

02. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.11.26 දින අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/v(1)13/17)

(අ) ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ හා ඊට අදාල ආයතන යටතේ පසුගිය වසර පහ තුල ඔබතුමා සහභාගී වූ විදේශ සංචාර ගණන කොපමණද ?

(ආ) සංචාරය කල රටවල් මොනවාද ?

(ඇ) කුමන කාරණා සඳහාද ?

(ඈ) වසර 05 ක කාලය තුල විදේශ සංචාර සඳහා ඔබ අමාත්‍යාංශය හා ඊට අදාල ආයතන වියදම් කල මුදල් වාර්ෂිකව වෙන වෙනම කොපමණද ?

(ඉ) එකී විදේශ සංචාර වල යෙදුන දින වකවානු මොනවාද ?

(ඊ) ඔබතුමා සමඟ මෙකී විදේශ සංචාර වලට සහභාගී වූ නිලධාරීන් පිළිවෙලින් කව්රුන්ද ?

(උ) ඔවුන් තෝරාගත් පදනම කුමක්ද ?

(ඌ) එකී සංචාර සඳහා වැය කල මුදල් වාර්ෂිකව වෙන වෙනම කොපමණද ?

(එ) මීට අමතරව මෙම කාලය තුල ඔබතුමා වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ විදේශ සංචාර වල නියැලුනේද ?

(ඒ) එසෙනම් ඒ දිනයන් හා රටවල් සඳහන් කරන්නේද ?

03. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට : (ප්‍ර/v(1)13/19)

(අ) ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පෞද්ගලික පාසල් ලියාපදිංචි කර තිබේද ?

(ආ) එම පාසැල් සංඛ්‍යාව කොපමණද ?

(ඇ) එම පාසැල් ප්‍රාථමික පාසැල් හා ද්විතික පාසැල් වශයෙන් වර්ග කොට ලියාපදිංචි කර තිබේද ?

(ඈ) නොඑසේනම් ඒ මන්ද ?

(ඉ) මෙම පෞද්ගලික පාසැල් නීති විරෝධී බව ඔබතුමා පිළිගන්නෙහිද ?

(ඊ) එසේ නම්, එම පාසැල් සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

"2013 දෙසැම්බර් මස 06 වන දිනට නියමිත වැඩ කටයුතු අවසන්ව විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2014 ජනවාරි මස 07 වන දින පෙ.ව. 9.30 ට රැස්විය යුතුය."

## VIII. පොදු කටයුතු

**ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා**

*"2014 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

[අදාල ලේඛන පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත 2013.11.26 වන දින සභා රැස්වීමේදී බෙදාහැර ඇත.]

- **2013 දෙසැම්බර් මස 03 වන දින පෙ.ව 09.00 ට**

  i. පොදු සාකච්ඡාව.
  (පෙ.ව 9.00 සිට ප.ව 1.00 දක්වා)
  (ප.ව 2.00 සිට ප.ව 5.00 දක්වා)

  ii. සභාව කල් තැබීම.

- **2013 දෙසැම්බර් මස 04 වන දින පෙ.ව 09.00 ට**

  i. පහත සඳහන් වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය (පෙ.ව 9.00 සිට පෙ.ව 11.00 දක්වා)

  ශීර්ෂ අංක 100 - ආණ්ඩුකාරවරයා
  ශීර්ෂ අංක 101 - බස්නාහිර පළාතේ පළාත් සභාව
  ශීර්ෂ අංක 102 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

  ii. ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන නීතිය හා සාමය ඉඩම්,අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂ ආර්ථික ප්‍රවර්ධන හා විදුලි බල හා බල ශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය.

  ශීර්ෂ අංක 104.109.110.111.112.113.114.115.

  (පෙ.ව 11.00 සිට ප.ව 1.00 දක්වා)
  (ප.ව 2.00 සිට ප.ව 5.00 දක්වා)

  iii. සභාව කල්තැබීම

- **2013 දෙසැම්බර් මස 05 වන දින පෙ.ව 09.00 ට**

i. සෞඛ්‍ය.දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය.

ශීර්ෂ අංක 105.116.117.118.119

(පෙ.ව 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා)

ii. ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන, ආ සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන කටයුතු පි ළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂ සම්බන්ධ විවාදය.

ශීර්ෂ අංක 107.122.123.      103

(මධ්‍යාහ්න 12.00 සිට ප.ව 1.00 දක්වා)
(ප.ව 2.00 සිට ප.ව 4.00 දක්වා)

iii. මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කට පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය.

ශීර්ෂ අංක 108.124.125.

(ප.ව 4.00 සිට ප.ව 5.00 දක්වා)

Iv. සභාව කල්තැබීම

- **2013 දෙසැම්බර් මස 06 වන දින පෙ.ව 09.00 ට**

i. මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කට පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය.

ශීර්ෂ අංක 108.124.125

(පෙ.ව 9.00 සිට පෙ.ව 11.00 දක්වා)

ii. කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු පිළ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය.

ශීර්ෂ අංක 106.120.121,126

(පෙ.ව 11.00 සිට ප.ව 1.00 දක්වා)
(ප.ව 2.00 සිට ප.ව 3.00 දක්වා)

iii. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂ අමාත්‍යතුමා

*"2014 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශයට විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

(අදාල ලේඛන පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත 2013.11.26 වන දින සභා රැස්වී බෙදාහැර ඇත.)

(ප.ව 3.00 සිට ප.ව 4.00 දක්වා)

Iv. සභාව කල්තැබීම

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2013.11.26 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

## බස්නාහිර පළාතේ පළාත් සභාව

### *2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය*

| ශීර්ෂය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / කාර්යාලය |
|---|---|
| 100 | ආණ්ඩුකාරවරයා |
| 101 | බස්නාහිර පළාතේ පළාත් සභාව |
| 102 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 103 | සමුපකාර සේවක කොමිෂන් සභාව |
| 104 | ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, මිනිස් බල හා රැකී රක්ෂා විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය. |
| 105 | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය. |
| 106 | කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරි මාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යාංශය. |
| 107 | ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය. |
| 108 | මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු අමාත්‍යාංශය |
| 109 | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 110 | ඉංජිනේරු කාර්යාංශය |
| 111 | ආදායම් දෙපාර්තමේන්තුව |
| 112 | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව |
| 113 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 114 | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| 115 | ඉඩම් දෙපාර්තමේන්තුව |
| 116 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 117 | ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 118 | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| 119 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| 120 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 121 | කර්මාන්ත දෙපාර්තමේන්තුව |
| 122 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| 123 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 124 | සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 125 | නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| 126 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |